PR/2018/20/S

# ජපන් තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව
දූ.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629
ඊ මේල්: cultujpn@sltnet.lk

ජූලි 06, 2018

## පුවත්පත් නිවේදනය

## ජපන් රජය මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා වෙත ගෞරව සම්මානයක් පිරිනමයි.

ජපන් ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා ප්‍රවර්ධනය කිරීම ඇගයීමක් වශයෙන් "ද ඕඩර් ඔෆ් ද රයිසින් සන්, ගෝල්ඩ් රේස් විත් නෙක් රිබන් (The Order of the Rising Sun, Gold Rays with Neck Ribbon)" යන සම්මානය මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා වෙත පිරිනැමීම පසුගිය ජූලි 6 වනදා ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කෙන්ඉචි සුගනුමා මහතා විසින් සිදු කෙරිණි. ජපන් අධිරාජ්‍යයාගේ නියමයෙන් පිදෙන මෙම සම්මානය සඳහා විශේෂ උත්සවයක් කොළඹ පිහිටි ජපන් තානාපති නිල නිවසේදී පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වෛද්‍යවරයකු මෙන්ම සංස්කෘතික ලැදියකුද වන මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා 2010 වසරේදී ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව සංස්කෘතික සම්මාන ( බුන්කා සම්මාන) කමිටුවේ සම- සභාපති ලෙස පත්කරන ලදී. ඔහුගෙන් මෙම කමිටුව වෙත ලැබුණු නායකත්වය සහ දායකත්වය බුන්කා සම්මාන ශ්‍රී ලංකාව තුල වඩාත් සුවිශේෂී තත්වයකට ගෙන ඒමටත් එම තත්වය ස්ථායීව පවත්වා ගැනීමටත් වඩාත් ඉවහල් විය.

වර්ෂ 1993 දී ස්ථාපනය කරන ලද ජපන් ශ්‍රී ලංකා සංස්කෘතික සම්මාන (බුන්කා සම්මාන) ශ්‍රී ලංකාවේ වඩාත් ගෞරවාන්විත සම්මාන ප්‍රදානයක් වන අතර, එහි අරමුණ වන්නේ විශිෂ්ට දක්ෂතා පෙන්වන මධ්‍යම මට්ටමේ ශ්‍රී ලාංකික කලාකරුවන් නගාසිටුවීමයි. මෙම සම්මාන වාර්ෂිකව පිරිනැමෙන අතර, මේ දක්වා කලාකරුවන් රැසකගේම කුසලතා වර්ධනය කරගැනීමට දායක වී ඇත. බුන්කා සම්මාන ප්‍රදානයේ ප්‍රගතිය සඳහා මහාචාර්ය ෆොන්සේකා මහතාගේ දීර්ඝකාලීන කැපවීම ඇගයීමට ලක් කෙරේ.

ජපන් රජයෙන් මහාචාර්ය ෆොන්සේකා මහතා වෙත පිදෙන මෙම සම්මානය, ජපන් රජයේ සහ ජපන් ජනතාවගේ කෘතඥතාවය සහ මිතුදම සඳහා සාධක සපයයි.

*********************************************************

වැඩි විස්තර සඳහා සංස්කෘතික අංශය අමතන්න
දු.ක :94-11-269-3831~3 ( දිගුව- 227)

PR/2018/20/S